

# පාළුවට ගිය මාලිගාව

## Deserted Palace

හාජි අහමද් රාසා (අත්තාරි)


දුරකථන : (011) 2394748/9

Email : maktaba@dawateislami.net

Website : www.dawateislami.net

# පාළුවට ගිය මාලිගාව

## (අනාථ වූ පාරාදීසය)

ලේඛක
ශේක් එ තරීකත් අමීරේ අහ්ලුස්සුන්නත්
හස්රත් අල්ලාමා මෞලානා අබූ බිලාල්
මුහම්මද් ඉල්යාස් අත්තාර්
(කාදිරී රzවි)

(دامت برکاتہم العالیہ)

ෆයිසානේ මදීනා
නො. 10, මැසන්ජර් වීදිය, කොළඹ - 12
දුරකථනය : (011) 2394748/9
Email : maktaba@dawateislami.net
Website : www.dawateislami.net

සාරාංශය


| | | |
|---|---|---|
| 1. | සලාවාතයේ මහිමය | 2 |
| 2. | දුබලකම | 2 |
| 3. | පාඩම (අත්දැකීම) | 5 |
| 4. | රවටින ලෝකය (මායා ලෝකය) | 6 |
| 5. | උණ ගස් පැල්පත | 7 |
| 6. | නිවස සමතලා කර දැමූහ. | 9 |
| 7. | උපදෙස් දෙන සෙල් ලිපිය | 11 |
| 8. | අංග සම්පූර්ණ ගෙය දැක ඇඬූහ (අලංකාර ගෙයකට සැලූ කඳුළු | 13 |
| 9. | මලකුල් මෞත් තුමාණන් පැවසූ දෙය | 13 |
| 10. | මරණයේ සිතුවිල්ල | 14 |
| 11. | කබ්රයේ දර්ශන රාත්‍රිය | 18 |
| 12. | මරණයේ සිතුවිල්ල අවශ්‍ය ඇයි? | 19 |
| 13. | සුව විමසීමෙන් ලැබුණු පිළිතුර | 20 |
| 14. | උදේ වරුව කෙසේ ගතවුණේ ද? | 20 |
| 15. | ඉතාමත් හොඳ ප්‍රතිඵලය | 21 |
| 16. | ලෝකය විනාශ වන්නේමය | 21 |
| 17. | අද කුසල් (අමල්) කරන දිනයයි | 22 |
| 18. | ලෝකය එලොව වෙනුවෙන්ම සූදානම් වූවකි | 23 |
| 19. | අමීරේ අහ්ලේ සුන්නත් තුමාණන් ගැන කෙටි හඳුන්වාදීමක් | 24 |

اَلْحَمْدُ لِلّٰهِ رَبِّ الْعٰلَمِيْنَ وَالصَّلٰوةُ وَالسَّلَامُ عَلٰى سَيِّدِ الْمُرْسَلِيْنَ

اَمَّا بَعْدُ فَاَعُوْذُ بِاللّٰهِ مِنَ الشَّيْطٰنِ الرَّجِيْمِ ؕ بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ

සමහර විට ඔබේ සිත මෙම පොත් පිංච කියවීමට බාධා කරයි. නමුත් ඔබ පිටු 27ක් වන මෙම පොත් පිංච සම්පූර්ණයෙන්ම කියවා ඔබේ ආකිරතය (පරලොව) සකසා ගන්න.

## සලවාතයේ වැදගත්කම්

අල්ලාහ් ( عَزَّوَجَلَّ ) ගේ ස්නේහවන්තයා මුද, සියලු රහස් දන්නා මුද, යහගුණයේ පැවැත්මද වන මුහම්මද් මුස්තෆා ( صَلَّى اللهُ تَعَالَى عَلَيْهِ وَآلِهٖ وَسَلَّم ) තුමාණන් මෙසේ පැවසූහ. යම් කිසිවෙක් දිනපතා මා වෙනුවෙන් 1,000 වතාවක් සලවාත් උසුරන්නේද, ඔහු ස්වර්ගයේ තමන්ගේ ස්ථානය දකින තෙක් මරණයට පත්වන්නේ නොමැත යනුවෙනි. (අත්තර්ගීබ් වත් තර්හීබ්, ජිල්ද් 2 පිටුව 499, හො 2483 දාර් ඉබ්නු කසීර් බෙයිරූත්)

صَلُّوا عَلَى الْحَبِيب! صَلَّى اللهُ تَعَالَى عَلَى مُحَمَّد

## දුර්වලකම්

හසරත් සෙයියිදුනා ජුනයිදුල් බග්දාදී ( عَلَيْهِ رَحْمَةُ اللهِ الْهَادِى ) තුමාණන් මෙසේ පැවසූහ. එක් වතාවක් මා කූෆා වලට ගොස් සිටින විට එහි එක් ධනවතකුගේ මාලිගාවක්

මාගේ දෑසට දක්නට ලැබිණි. නැටුම් සංගීතයෙන් පිරුණු එහි ප්‍රධාන දොරකඩ සේවකයන්ගෙන් පිරී තිබිණි. උඩු මහල් එළිමහනේ සිට මිහිරි කටහඬක් ඇති සේවිකාවක් මෙසේ ගයමින් සිටියාය.

ඒ මාලිගාව ඔබ තුළ දුක් කවදාවත් ඇතුල්විය නොයුතුයි. ඔබ තුළ ජීවත්වන අය කාලයෙන්ද විනාශ නොවිය යුතුයි. මේ දර්ශනය දුටු මා එතැනින් ඉවත් වුනෙමි.

ටික කලකට පසු එම පාරෙන්ම මට යන්න සිදු වූ විට සේවකයින් කිසිවෙක් දක්නට නොලැබුණු එම මාලිගාව අඳුරැවී තවද පාළුවී කඩා වැටෙන්න ආසන්නව දක්නට තිබුණි. අද එහි ස්වරූපය කලින් තිබූ පොජ ස්වරූපය වෙනුවට එහි විනාශයේ ලක්ෂණ පෙන්නුම් කරමින් තිබිණි. අද එම මාලිගාව නැටුම් සංගීත වෙනුවට නිශ්ශබ්ද දුක්මුසු තත්වයක් තිබුණි. එම භයංකර පාළු මාලිගාව ගැන මා විමසූ විට එහි අයිතිකරු මරණයට පත් වූ බවත් සේවකයින් සැවොම අන්වී ගිය බවත් දැන ගන්නට ලැබුණි. හසරත් සෙයිදුනා ජුනයිදුල් බග්දාදී عليه رحمة الله القوي ) තුමාණන් මෙසේ පවසති. මම ඒ පාළු වූ මාලිගාවේ දොරට තට්ටු කළෙමි. එවිට ඇතුලෙන් සේවිකාවකගේ දුබල කටහඬක් ඇසුනි. මම ඇයගෙන් දිලිසෙමින් තිබූ මෙම මාලිගාවේ ප්‍රසන්න බව හා අලංකාර බව කොහේද? මෙහි ජීවත් වූවනට සිදුවූයේ කුමක්ද? කියා ඇසුවෙමි. මාගේ ප්‍රශ්නයට ඇය කඳුළු සළමින් එම පාළු මාලිගාවේ දුක්බර කථාව කීමට ආරම්භ කළාය.

''මෙම මාලිගාවේ ජීවත් වූ අය මෙහි ස්වල්ප කාලයයි ජීවත්වූනේ. දෛවය ඔවුන්ට මාලිගාවේ සිට කබ්රයට (සොහොන) තැන් වෙනස් කළේය. මෙහි සුව ජීවයෙන් ජීවත් වූ අයගේ සැප සම්පත් වලටත් තාන්න මාන්න අන් ක්‍රියාකාරකම් වලට නැවතීමේ තිත තැබිණි. මෙය අලුත් ආරංචියක් නොවේ. මෙයයි ලොවේ යථාර්ථය. කවුරුත් ලොවට පැමිණ එහි සුවය විඳ පාළුවූ කබ්රයට සම්ප්‍රාප්ත වන්නේය. මෙම ලොව කෙරෙහි විශ්වාසය තැබූ අයව ලොව ඉතා ඉක්මනින් රවටයි කියා පැවසුවාය. එවිට මම ඇයගෙන් "දවසක් මම මේ පාරෙන් යන විට මෙම මාලිගාවේ එළිමහනේ ඒ මාලිගාව ඔබ තුළ දුක් කවදාවත් ඇතුල් විය නොයුතුයි. ඔබ තුළ ජීවත්වන අය කාලයෙන්ද විනාශ නොවිය යුතුයි. කියා ගායිකාවක් ගැයුවානේද? කියා කියූ විගස අඬ අඬා එම කාන්තාව මමයි එම කාලකන්නි ගායිකාව මෙම මාලිගාවේ ජීවත් වූ අයයෙන් දැනට ඉතිරි වී ඇත්තේ මම පමණයි" කියා තිත් වේදනාවෙන් යුතුව පැවසුවාය. පසුව ඇය දිගු හුස්මක් හැර "මේ ඔක්කෝම දැකීමෙන් පසු මෙම විනාශ වන ලෝකයේ තමාගේ පූර්ණ දායකත්වයට දී මරණය අමතක කර ජීවත්වන අයට මම අනුකම්පා දක්වමි." කියා පැවසුවාය. (රවිසුල් රියාහීන් පිටුව 110 පිටපත-දාරුල් මක්තබා මෛමනීයා මිසර්)

# පාඩම්

මාගේ දයාබර ඉස්ලාමීය සහෝදරවරුනි! මෙම පාළුවූ මාලිගාවේ තත්වය ඒ තුල ජීවත් වූ අයගේ මරණය විනාශ වූ සතුට, තවද ඇදහිය සිදුවීම් අපට ඉමහත් පාඩමකි. ආහ්! ඔවුන් විනාශ වන මේ මායා ලෝකයේ සුව විඳිමින් හා සැප විඳිමින් කාලය නාස්ති කරමින් තමන්ගේ විනාශය ගැන නොසිතා මරණය ගැන සිතුවිල්ලක් නොමැතිව ටික දිනක් වාසය කරන මෙම ලොවේ සතුටු වලට නැඹුරුවීමෙන් සදාකාලීන නොවූ මේ මිහිතලේ ක්ෂණික මරණය ගැන නොදැන විශාල අනර්ඝ මාලිගා සෑදීමේ හා එය පහසුදායක ලෙස ප්‍රසන්න භාණ්ඩ භාවිතා කර එය අලංකාර කිරීමෙන් කාලය නාස්ති කරගත්තෝය. තවද ඔවුන් කබ්රයේ අඳුර ගැන හා එහි භයානකත්වය ගැන දුක් නොවී දිලිසෙන විදුලි බුබුළු වලින් තමන්ගේ නිවස එළිය කර ගත්තෝය. භාර්යාව ළමයින්ගේ තාවකාලික ආදරයෙන් හා සෙනෙහසින් මිතුරන්ගේ කෙටි මිතුදම් වලින් සේවකයන්ගේ ප්‍රමාණයට වැඩි සැලකිලිමත්කම නිසාත් ඔවුන් කබ්රහි තනිකම අමතක කළ අය ලෙස සිටියෝය.

නමුත් ක්ෂණිකව අවසානයේ හෙණ පතිත විය. මරණයේ සුළඟ හමන ලදී. සදාකාලිකව මිහිතලේ ජීවත්වීම ඔවුන්ගේ සිතුවිලි සුනු විසුනු වී දූවිලි බවට පත්විය. තවද ඔවුන්ගේ විනෝදයෙන් සිනහවෙන් හා සතුටෙන් පිරි ඉතිරී තිබූ නිවස මරණය විසින් පාළු කර දැමීය. ඔවුන් විදුලි බුබුළු වලින් දිලිසූ නිවෙසත් අඳුරැ වූ කබ්ර

වෙත සදාකාලිකව මාරුකර යැවීය. ආහ්! ඊයේ දිනක තෙක් හැඳෑ හිතමිතුරන් සමග සතුටින් ජීවත් වූ ඔවුන් අද කබ්ර්හි භයානක තනිකමින් වෙව්ලමින් සිටිති.

1. මරණය කිස්රාව හෝ කාරාව අත්හැරියේ නැත. දිනුමේ සෙන්පති (විරයාණන්) සික්කන්දර්ද මරණය ඉදිරියේ පරාජය භාරගත්තේය.
අප්‍රමාණ ආශාවන් මැවූ ඔවුන්ගේ සැම සැප සම්පතක්ම මෙම ලොවෙහිම රැඳුනි.
2. මනස (සිත) සසල කර රැවටෙන තැන නොවෙයි. මෙම ලෝකය ඉගෙනුම ලබන තැනයි. විහිළු නැත.

## රැවටිවන ලෝකය

මෙම කතාවේ අවසානය එයේම සේවිකාවගේ අවවාදයේත් පාඩමට ගත යුතු (දැනගැනීමට) වැදනි පුෂ්පයන් (වැදනි පුස්තකල්) කිහිපයක් ඇත. නමුත් කණගාටුයි ලොවෙහි මායා පාලයන් දැක එහි රැවටී මරණයද සහමුලින්ම අමතක කර නොදැනුවත්කමෙහි ගිලිහී සිටින අයගේ තත්වය අනුකම්පා සහිතයි. සත්තකින්ම කෙනෙක් මෙලොව ජීවිතයේ මායාවන්ට අවනතවී තමන්ගේ මරණය හා නොහොත අමතක කර සර්වබලධාරී අල්ලාහ්ගේ කරුණාව දයාව ලැබීමට පින් (කුසල්) නොකර සිටින්නේද අනිවාර්යයෙන් ඔහු දුකුවම් ලැබිය යුත්තෙකි. මෙසේ රැවටීමෙන් අපව ආරක්ෂා කර ගැනීමට ප්‍රාර්ථනා කරමු. අල්ලාහ් ( عزوجل ) අල්කුර්ආන්හි 22 වැනි ආයත්හි මෙසේ අවවාද කරයි.

يَا أَيُّهَا النَّاسُ إِنَّ وَعْدَ اللَّهِ حَقٌّ فَلَا تَغُرَّنَّكُمُ
الْحَيَاةُ الدُّنْيَا وَلَا يَغُرَّنَّكُم بِاللَّهِ الْغَرُورُ ﴿٥﴾

මිනිසුනි, ඇත්ත වශයෙන්ම අල්ලාහ් තආලාගේ පොරොන්දුව සත්‍යයි. එම නිසා මෙලොව ජීවිතයේ (කවදාවත්) ඔබව මුලා නොකරන්න.

ඇත්ත වශයෙන්ම කිසි කෙනෙකු මරණයත් ඉන් එහා ඇති දේවල් දැන ගතහොත් මෙලොව මායාවන්ට රැවටෙන්නේ නැත.

## උණ ගස්පැල්පත

හසරත් සෙයිදුනා නූහ් ( عليه السلام ) තුමාණන් සාමාන්‍ය උණ ගස් වලින් හැදූ පුංචි පැල්පතක ජීවත්වූහ. එතුමාණන්ගෙන් ඔබ තුමාණන් ලොකු ගෙයක් සාදා නොගන්නේ ඇයි ? දැයි විමසූ විට එතුමාණන් මෙසේ පැවසූහ. මැරෙන්නාට (මරණය ගැන විශ්වාසය කරන්නාට) මෙයත් ලොකු වැඩියි (අල් අක්දුල් ෆරීද් ජු. 3 පිටුව 146 දාර් අහ්යාත් රොව්සුල් අරබි බේරූත්)

අද මරණය ගැන නොසිතා ඒ වෙනුවට ලස්සන මන්දිරයන් අලංකාරවත් ගෙවල් තැනවීමට උත්සුක වෙමින් සිටීම කණගාටුවට කරුණකි. අපේ ගෙවල් යන සැප පහසු වස්තූන් එකතු කරමින් තත්වයට එහා අලංකාරවත් කරමින් සිටිමු. මෙය එක් අරාබි කවියෙක් වේදනාවෙන් පිරුණු වචන වලින් අපට පහදන්න උත්සාහ කර ඇත.

زَيَّنْتَ بَيْتَكَ جَاهِلاً وَعَمَرْتَهُ    وَلَعَلَّ غَيْرَكَ صَاحِبُ الْبَيْتِ
مَنْ كَانَتِ الْأَيَّامُ سَائِرَةً بِهِ    فَكَأَنَّهُ قَدْ حَلَّ بِالْمَوْتِ
وَالْمَرْءُ مُرْتَهِنٌ بِسَوْفَ وَلَيْتَ    وَهَلَاكُهُ فِي السَّوْفِ وَاللَّيْتِ
فَلِلّٰهِ دَرُّ فَتًى تَدَبَّرَ أَمْرَهُ    فَغَدَا وَرَاحَ مُبَادِرَ الْمَوْتِ

## කවියේ තේරුම

1. (මෙලොව යථාර්තයත් පරලොව සත්‍යයත්) නොදන්නා කමින් ඔබ ඔබේ ගෙය ඉදි කිරීමෙන් හා එය අලංකාරවත් කරමින් සිටිනවා. (ඔබේ මරණයට පසු) සමහර විට වෙන කෙනෙක් මෙහි පාලනය කළ හැක.
2. යම්කිසි කෙනෙක් (කබ්රය දක්වා) ඇදගෙන යන්නේද ඔහුට මරණය සමුවී ඇති බව දැන ගත හැක. එනම් ඔහු ඉක්මනින් මරණයට පත්වන්නේය.
3. තවද මිනිසා (ලෝකයේ ආශාවන් බලාපොරොත්තුවෙන්) බලාපොරොත්තු දැලේ හිරවී සිටියි. නමුත් මෙම මායා බලාපොරොත්තු වල ඔහුගේ විනාශය සැඟවී ඇත.
4. යම් කිසිවෙක් තමන්ගේ (කබ්රයත් එලොවත්) ගැන දුක්වී රෑ දවල් මරණයට ලැස්ති වෙයිද, එම තරුණයාට කුලිය අල්ලාහ් වෙතයි.

අල්ලාහ් තආලාගේ දයාබර සැඟවූ දෑ සියල්ල දන්නා වූද, කිසියම් අඩුපාඩුවකින් තොර වූද, නබි නායක ( صلى الله تعالى عليه وآله وسلم ) තුමාණන් අලංකාර නිවාස තැනීමට කවදාවත් කැමති නොවූහ. මේ ගැන අබූ දාවුද් ග්‍රන්ථයේ දී ඇති රිවායතයක් තේරුම් ගැනීමට උත්සාහ කරමු.

# තට්ටු නිවාස කඩා සමතලා කෙරූහ.

හසරත් සෙයිදුනා අනස් ( رضي الله تعالى عنه ) තුමාණන් මෙසේ පැවසූහ.

එරක් නබි නායක ( صلى الله تعالى عليه وآله وسلم ) තුමාණන් සමග අප එක් මාර්ගයේ ගමන් කරමින් සිටින විට රසූල් ( صلى الله عليه وسلم ) තුමානන් එක් දෙමහල් අලංකාර නිවසක් දැක මෙය කුමක්ද? යැයි විමසීය. සහාබාවරුන් මෙය එක් අන්සාරිවරයෙකුගේ නම කියා ඔහුගේ යැයි පැවසූහ. එය අසා නබි නායක ( صلى الله تعالى عليه وآله وسلم ) තුමාණන් නිශ්ශබ්දව එතැනින් නික්ම ගියහ. පසුව එම නිවසේ අයිතිකරු නබි නායක ( صلى الله تعالى عليه وآله وسلم ) තුමාණන්ගේ ශුද්ධ සභාවට පැමිණ සලාම් පැවසූවිට නබි නායක ( صلى الله تعالى عليه وآله وسلم ) තුමාණන් ශුද්ධ වූ මුහුණ අනෙක් පසට හැරවූහ. මෙසේ කිහිප වතාවක්ම සිදුවිය. මෙයින් මහත්සේ වේදනාවට පත් එම අන්සාරිවරයාණන් සහාබාවරුන්ට බලා අල්ලාහ්තආලා ගැන දිවුරා කියමි මා සමග රසූල් ( صلى الله تعالى عليه وآله وسلم ) තුමාණන් කෝප වී ඇතැයි පැවසීය. මෙය ඇසූ සහාබාවරුන් එක් වතාවක් නබි නායක ( صلى الله تعالى عليه وآله وسلم ) තුමාණන් එම මාර්ගයේ ගමන් කරමින් සිටින විට ඔබේ නිවස දුටුහ. (එනම් එතුමාණන් තරහ වීමට හේතුව ඔබේ නිවස උසට පිහිටීමයි) යැයි පැවසෙත්ම එම අන්සාරි වරයාණන් පැමිණ තම නිවස කඩා පොළොවට සමතලා කර දැමූහ. (සුනන් අබූදාවුද් හදීස් නො 5237 ජු: 4 පිටුව 402 මක්තබා දාරුල් ෆික්ර් බේරූත්)

මා දයාබර ඉස්ලාමීය (මුස්ලිම්) සහෝදරවරුනි! මෙය සහාබාවරුන් නබි නායක ( صلى الله تعالى عليه وآله وسلم ) තුමාණන්ට ද සිදු ගෞරවයට එක් උදාහරණයක්. මුෆස්සිරේ ෂහීර් හස්රත් මුෆ්ති අහ්මද්යාර් ඛාන් ( عليهم الرضوان ) තුමාණන් මෙම හදීසයෙන් දන්වන්නේ සියළු මැවීම් වලට රහමත් වූද අල්ලාහ් ( عزوجل ) ගේ ප්‍රියාදර වූද අප නබි නායක ( صلى الله تعالى عليه وآله وسلم ) තුමාණන් එම මිතුරාට තම නිවස කඩා දැමීමට අණ කිරීමක් හෝ එවැනි ගෙවල් හැදීම තහනම් කර නැත. නමුත් එම සහාබිවරයාණන්ට සැකයක් ඇති වුණා මෙම නිවස නිසා තමයි නබි නායක ( صلى الله تعالى عليه وآله وسلم ) තුමාණන් මා සමග තරහ වුණේ. ඒ නිසාම ඔහු සිතුවා මෙම නිවස මාගේත් අති උත්තම නබි නායක ( صلى الله تعالى عليه وآله وسلم ) තුමාණන් අතරත් බාධාවක් ඇති කළේ යැයි එය කඩා දැමීය. මෙය කඩා දැමීම මිල මුදල් නාස්ති කිරීමක් වන්නේ නැත ඒ වෙනුවට නබි නායක ( صلى الله تعالى عليه وآله وسلم ) තුමාණන්ව සතුටට පත්කිරීම ඔහුගේ උතුම් චේතනාවයි. අල්ලාහ්ගේ දූතයාණන් එම ගොඩනැගිල්ල විනාශ කර දැමීමෙන් සතුටු වන්නේ නම් ඇත්ත වශයෙන්ම මෙය ලාබෙට ලැබුණු වස්තුවක්.

සෙයිදුනා ඉබ්‍රාහිම් ( على نبينا وعليه الصلاة والسلام ) කලීලුල්ලාහ් අල්ලාහ් ( عزوجل ) ට කීකරුවී ඔහුගේ සතුට වෙනුවෙන් තමන්ගේම ආදරණීය පුතණුවන්ව කුර්බාන් දෙන්නට ලෑස්ති විය. (මිර්ආත් ෂර්හ්මිෂ්කාත් තො. 7 පි. 21 නයීමි පොත්හල ගුජ්රාත් පකිස්ථාන්

හසරත් සෙයිදුනා ඉස්මායිල් (عليه الصلاة والسلام) Zබිහුල්ලාහ් තුමාණන්ගේ කුර්බාන් ගැන අල්කුර්ආනයේ ප්‍රසිද්ධව ඇත. මෙය එතුමාණන්ට දෙන ලද විශේෂත්වයයි. මින්පසු කිසිම කෙනෙක් හීනෙන් තමන්ගේ දරුවන්ගේ කුර්බාන් කිරීමට අණ ලැබුණත් එසේ කළ නොහැක. එසේ කළහොත් ඔහු ඝාතකයෙක් වී නිරයට යයි.

## පාඩමක් කියා දෙන ගල් ලිපියක්

හසරත් සෙයිදුනා අබුZකරියියා තිමි ( عليه رحمة القوي ) තුමාණන් මෙසේ පැවසූහ.

කලීෆා සුලෙයිමාන් බින්අබ්දුල් මලික් මස්ජිදුල් හරාම්වල සිටින විට ඔහු වෙත ගලක් ගෙන එන ලදි. එහි කුමක්දෝ (කැටයම්) කොටා තිබුණි. ඔහු එය කියවීමට කෙනෙක් කැටුව එන ලෙස අණ කරත්ම ප්‍රසිද්ධ තාබිඊන් වරයෙකු වන හසරත් සෙයිදුනා වහබ් බින් මුනබ්බිහ් ( رحمة الله تعالى عليه ) තුමාණන් කැඳවා එය කියවන ලෙස දැන්විය.

එහි ලියා (කොටා) තිබුනේ ආදම්ගේ පුතණුවනි! ඔබ ඔබේ මරණය ළඟා වන බව දනිනම් ලොකු ආශාවන් අතහැර තමන්ගේ පින් (කුසල්) වැඩිකර මෙලොව දේපල රැස් කිරීම අඩු කිරීමට සිතන්න (අමතක නොකරන්න) කිසි හේතුවකින් ඔබේ පය ලිස්සුවොත් කියාමත් දිනයේදී ඔබට පසු තැවෙන්න සිදුවෙයි. ඔබේ අඹු දරුවන් ඔබව අප්‍රිය කරන්නත් ඔබව කරදරයකට පටලවන්නත් ඔබේ

මාපියන් නෑදෑයන් ඔබෙනත් වෙන්වෙන්නත් පුළුවන්. ඔබේ දූදරුවන්ද ඔබට උදව් නොකරති. එවිට ඔබට මෙලොවට පැමිණෙන්න හෝ නැවත කුසල් (පින්) කරන්න හෝ අවස්ථාවක් නොලැබේ. එවැනි දුක්මුසු තත්වයකට පත්වීමට පෙර එලොව ජීවිතය වෙනුවෙන් පින් (කුසල්/අමල්) කරමු. (Zසම්මුල් හවා පාඩම් 50 පි 498 දාරුල් කුතුබුල් ඉල්මියා බේරූත්)

මා දයාබර ඉස්ලාමීය (මුස්ලිම්) සහෝදරවරුනි! ඇත්තටම බුද්ධිමතා කවිද? තමන්ගේ අතීතය ගැන සිතා බලා තමන්ගෙන් සිදුවූ සියළු වැරදි වලට පසුතැවිලි වී පාපෝච්චාරණය කරන්නා නියම බුද්ධිමතා වන්නේය. වැඩි කාලයක් ජීවතුන් අතර සිටිමියි කියන රැවටිල්ලට හසු නොවී කබ්රයට (සොහොනට) එලොවටත් කුසල් කිරීමට ආරම්භ කළ යුතුයි. මුදල්, දේපල, අඹු දරුවන්ගේ සෙනෙහස රස විඳිමින් කුසල් (අමල්) සත් ක්‍රියාවන් අත් නොහැර පව් ක්‍රියාවන් නොකර සිටිය යුතුයි. මක් නිසාදයත්. මේ සමය අප ජීවිතය ටික කලකි. නමුත් කබ්රයේත්, එලොවේත් අපේ පින් කුසල් (අමල්) අපට උදව් කරයි. නෑදෑයන් හිත මිතුරන් ටික කලකින් සියල්ල අත් හරින්නේමයි.

මා හිතාදර ඉස්ලාමීය (මුස්ලිම්) සහෝදරවරුණි! මරණය දැස් ඉදිරිපිට තබාගෙන සිතන විට පමණක් එලොව ගැන සිතීමට හොඳ අවකාශයක් ලැබෙන්නේය. තවද විනාශ වී යන ලෝකයටත් නැති වී යන වස්තූ වලටත් හිතට ඉඩක් නොදිය යුතුයි. මේ ලෝකයේ කුමක් හරි

වස්තුවක් දැක ආශාවක් ඇති වූ විට මෙය විනාශ වන වස්තුවක් නැතහොත් මට මෙය අත්හැර යන්න සිදුවන බව සිහිය යුතුයි.

නැතිවිය අපෙන් හිතමිතුරන් සමහරක්
සැමදා ඇත් වෙමින් සිටින කෙනෙකුට පසු කෙනෙක්
සැමදා දැස් ඉදිරිපිට සිදුවන දේවල් මේය

සිත සසල කර රැවටෙන තැන නොවෙයි මෙලොව
මෙය ඉගෙනුම ලබන තැනයි විසිළ නැත.

## සශ්‍රීක (සරු) ගෙයක් දැක ඇඬුහ

දිනක් හසරත් සෙයිදුනා ඉබිනු මුතිඃ තුමාණන් සන්තෝසයෙන් තමන්ගේ ගෙය බලාගෙන සිට එක විටම අඬමින් මෙසේ පැවසුහ. අලංකාර ගේ අල්ලාහ්ගේ නාමයෙන් දිවුරමි. මරණයක් කියා දෙයක් නොමැති නම් මම ඔබේ අලංකාරත්වය ගැන සතුටු වෙමි. සිරවෙන කබ්රය තුළ යන්න නොලැබේ නම් මේ ලෝකයේ ලස්සන දැක මගේ දෑස් සිසිල්වන්නට තිබුණි යැයි කියමින් ඉකි බිඳමින් ඇඬුහ. (අක්සාඩාතිල් මුත්තකීන් 14 කොටස 33 පිටුව)

## මලකුල් මෞත් පැවසූ දේ

හසරත් සෙයිදුනා මලකුල් මෞත් ( عليه الصلاة والسلام ) තුමාණන් එක් මිනිසෙකුගේ පණ අත්පත් කර ගැනීමට

පැමිණි විට ඔබ කව්දැයි ? එම මිනිසා ඇසීය. එවිට මලාඉකාවරයාණන් මම රජ වරුන්ටත් බිය නැති මාලිගාවල්වල ආයුධ සන්නද්ධ දොරටු පාලකයන්ටත් නතර කළ නොහැකි තරම්ද මම පයාවිද නොයනිමි යැයි පැවසූහ. එවිට එම මිනිසා එසේ නම් ඔබ මලකුල් මෞත් විය යුතු යැයිද, මම මරණයටත් එලොවටත් ලෑස්ති වුනේ නැතැයි පවසා දුක්විය. එවිට ඔබගේ මිතුනොවුන් දැන් කොහේද? ඔබගේ නෑදෑයන් කොහිද? යැයි විමසීය. එවිට එම මිනිසා ඔවුන් මැරුණා යැයි පිළිතුරු දීය. එවිට මලකුල් මෞත් වරයාණන් ඔවුන්ව දැකලත් එය පාඩමකට නොගත්තේ ඇයි? ඇයි ඔබ තමන්ගේ එලොව (පරලොව) ජීවිතය ගැන සිතා ලෑස්ති නොවූයේ යැයි පවසා ඔහුගේ පණ අත්පත් කර ගත්හ. (අල් මුස්තද්රක් කොටස 2, පිටුව 274 දාරුල් ෆික්ර් බේරූත්)

මා සිතාදර ඉස්ලාමිය (මුස්ලිම්) සහෝදරවරුනි! අනුන්ගේ මරණය දැක තමන්ගේ එලොව ජීවිතය වෙනුවෙන් තමන්ව ලෑස්ති කරන්නා උගතුන්ගේ කියුමට බුද්ධිමතා වන්නේය.

اَلسَّعِيْدُ مَنْ وُعِظَ بِغَيْرِهٖ

"අනුන්ගේ උපදෙස් ලබන්නන් ජය ලබන්නෝය"

## මරණයේ සීතිවිලි

ඕනෑවිට එපාවිට මෙන් මරණය ගැන සිහියෙන් ඔබට නියම පළ නොලැබෙයි. සැමදා මරණයන් දක්නට ලැබෙයි.

සමහර විට එම අත්වලින්ම කබ්රයේ තබාලයි. පස් දමයි. නමුත් මරණය ගැන ඔහු සිතන්නේ නැත. මරණය ගැන සිතීමට නියම ක්‍රමය නම් තනිවී සියලුම සිතිවිලි ඈත් කර පළමුවෙන්ම තමන්ගේ මළ ගිය නෑදෑයන් හිත මිතුරන් ගැන සිතීමයි. තමන්ට ආසන්නව සිටි මරණයට පත් වුවන්ව සිතා ඔවුන්ගේ මුහුණ මතකයට ගෙන ඔවුන් මෙලොව තමන්ගේ අධිෂ්ඨානයන් (සැලසුම්) සම්පූර්ණ කරන්න දීර්ඝ හීනයක් හිස මත තබාගෙන ලෝක දැනුමෙන්ම ආලෝකමත් අනාගතයක් ඉලක්ක කර ගෙන සිටියහ. තවද වසර ගණනාවකින් ඉවර කරගත නොහැකි සැලසුම් සකස් කරමින් සිටියහ. මෙලොව ජීවිතය වෙනුවෙන් සියලු අගහිගකම් දුක් කරදර විඳ දරා ගත්හ. මෙලොව යහපත සඳහාම හැම විටම ඉදිරියට පැමිණ වැඩ කළහ. මෙලොව වස්තූන් මොවුන්ට රසත්, මෙලොව සැනසීම මොවුන්ට සැපවත්ව තිබිණි. අපි මැරෙන්නේ නැහැ යන සිතුවිල්ලෙන් ජීවත්වූහ. ඔවුන් මරණය අමතක කර මෙලොව ආශ්වාදයන්ගෙන් නැටුම් ගැයුම් වලින් උමතුවී සිටියහ. ඔවුන්ගේ කපන් (මිනිය වසන රෙදි කැබලි) වෙළඳ පොළට පැමිණි බව නොදැන මෙලොව ආශ්වාදයන්ට වශීවී සිටියහ.

ආහ්! මෙසේ ඔවුන්වත් නොදැනී මරණය පැමිණ ඔවුන්ව කබ්රයට (සොහොනට) ඇද දැමීය. ඔවුන්ගේ දෙමාපියන් ශෝකයටත්, බිරිඳ වැන්දඹු භාවයටත්, ඔවුන්ගේ දරුවන් අඬ අඬා අනාථ භාවයටත් පත්විය. මොවුන්ගේ අනාගත බලාපොරොත්තු සියල්ල සුනු විසුනු විය. ඔවුන්ගේ සැලසුම් සියල්ල අතරමග නතර විය. ඔවුන් තමන්ගේ අනාගතය

වෙනුවෙන් කරපු සියලූ ප්‍රයත්නයන් එක විට නැවතුණි. ඉතිරි කර තබා ගිය වස්තූන් (මිල මුදල් දේපල) වාරිස් (මොවුන්ගේ දේපළට අයිතිකරුවන්) මහුව අමතක කරමින් බෙදාගෙන භුක්ති විඳිති. මෙම සිතුවිලි වලට පසුව කබ්රයේ මොහුගේ තත්වය ගැනත් සිතන්න. මෙලොවෙහි මහුගේ ශරීරය කොපමණ ලස්සනට තිබෙන්නට ඇත්ද? ආහ්! මොහුගේ ලස්සන මුහුණ අවලස්සන (විරූපී) වී ඇත. මවුන් සිනාසෙන විට දිලිසුනු දත් පෙළ නමුත් දැන් ඒ දත්පෙළ ගැලවී විසිරී තිබෙන්න පුළුවන්. මවුන්ගේ අලංකාරවත් කිසකෙස් කබ්රය තුල විසිරී තිබිය හැක. මවුන්ගේ සිනිඳු නාසයේ පණුවන් හලියමින් (පසාරු කරමින්) තිබිය හැක. මොවුන්ගේ රෝස මල්පෙති වගේ දෙතොල පණුවන් රස විඳිමින් සිටිය හැක. තම දරුවන්ගේ දුක්මුසු ඇඬුම අසා තම සිහින් දුක්වී තුවන දිවෙන් ස්නේහවන්ත ලෙස ආදර බස් දෙසුවද එම දිව පණුවන්ට රස බෝජුනක්වී තිබිය හැක. සුව පහසු ඇඳන්වල සැපට සැතපු ශරීරයන් පස්වී ගොස් ඇත. මොවුන්ගේ සියලූ අංගයන් වෙන් වෙන්ව විසිරී ගොස් ඇත.

මේ සියල්ල සිතට ගැනීමෙන් පසු ආහ්! මටත් ඉතා ඉක්මනින් මෙය සිදු වන බව සිතන්න. මටත් සහරාත් නැමති වේදනාව පැමිණෙයි. එම අවස්ථාවේ දැස් උඩ බලාගෙන ඇත. හැදෑ සිත මිතුරන් එකතු වෙති. මව මගේ හදවත මගේ හදවත කියමින් විලාප දෙමින් සිටියි. පියා මගේ පුතේ මගේ පුතේ කියමින් අඬයි. සහෝදරයන් අපේ සහෝදරයා කියමින් අඬති. ස්නේහවන්තයන් පාලනය කළ නොහැකිව ඉකි බිඳිමින්

අඬයි. ඒ අතර තුර මාගේ පණ (ප්‍රාණය) අත්පත් කරගනු ලැබේ.

කව්රුන් හෝ ඉදිරියට පැමිණ මාගේ දෑස් වසනු ඇත. මාගේ ශරීරය සුදු වස්ත්‍රයකින් වසනු ඇත. ස්නේහවන්තයන්ගේ විලාපයෙන් භූමිය දෙදරයි. මාගේ මිනිය (ජනාසාව) නෑවීමට කෙනෙක් පැමිණ මාව ජනාසාව නාවන මේසය මත දිගා කර නාවයි. පසුව කෆන් අන්දවනු ලැබේ. ඇඬුම් (විලාප) ශබ්දයන් සමග මම සැමදා ජීවත් වූ එම ගෙදරින් මාගේ ජනාසාව (දේහය) ගෙන යනු ලැබේ. මාගේ නැදැයන් හිත මිතුරන් කබ්රය තුළ මාව තබා කර සියලු දෙනාම නික්ම යති. මගේ සිත සනසන්න. තනිකම නැති කරන්න. කිසිවෙක් එහි රැඳී සිටින්නේ නැත. ආහ්! කබ්රයේ මාගේ සිරුර අඬන්න පටන් ගනී. එහි පණුවන් මාගේ දකුණු ඇස, වම් ඇස රස විඳියිද, නොදනිමි. මාගේ දිව රස බලයිද? නැතහොත් මාගේ දෙතොල් රස විඳියිද? ආහ්! කොච්චර නිදහසින්ද, පණුවන් නලියන්නේ, මෙසේ ඔබ ඔබේ මරණයෙන් කබ්රයේ ජීවිතය ගැනත් විටින් විට කල්පනා කරන්න. නැවත නැවතත් මතකයට නගන්න. පසුව මුන්කර්, නකීර් යන මලාඉකාවරුන්ගේ පැමිනීම ඔවුන්ගේ ප්‍රශ්ණ වලට පිළිතුරු දීම කබ්රයේ ලැබිය හැකි දඬුවම් ගැන සිතා පැමිනිය හැකි දේවල් ගැන තමාව බිය ගන්වන්න. මෙසේ සිතුවිලි වලින් මරණය ගැන සිතමින් ඉන්ශා අල්ලාහ් මරණයේ දුක් වේදනාව දැනීමෙන් කුසල් (පින්) කිරීමටත්, අකුසල් වලින් මිදීමටත් සිත පෙළඹෙයි. මරණය ගැන සිහිමට අඩු තරමින් මසකට වරක්වත් කාමරය අඳුරු කර නැතහොත් තනිවී පාළු මාලිගාව බයාන් කැසට් එක දාගෙන හෝ නැතහොත් මෙම පොත් පිංචය කියෙව්වත්,

කියවන විට අසා සිටියත් ඉන්නා අල්ලාහ් ( عزوجل ) මෙයින් නියම ප්‍රතිඵල ලබාගත හැක.
මා හිතාදර ඉස්ලාමීය (මුස්ලිම්) සහෝදරවරුනි! අපේ මුතුන් මිත්තන් සෑම වෙලේම අල්ලාහ්ට බියවී මරණයත්, කබ්රයත්, එලොව ජීවිතයත් ඉදිරියෙන් තබා සියලු වැඩ කළහ. එම නිසාම ඔවුන් අගුණ (නරක) වැඩ වලින් ඈත්වී හොඳ දේවල් වලටම පෙළඹුණහ. ඒ නිසාම විනාශ වී යන මෙම ලොවට වශී නොවී අල්ලාහ්ට බියෙන් සෑම වෙලේම ඇඬු කඳුලින් ජීවත් වූහ.

## කබ්රයේ දීර්ඝ රාත්‍රිය

හසරත් සෙයිදුනා යසීද් රකාෂි ( عليه رحمة الله القوي ) මෙසේ පැවසූහ. අපි ආමිර් ඉබ්නු අබ්දුල්ලාහ් ( عليه رحمة الله ) ළඟට ගිය අවස්ථාවක එතුමාණන් හුල්ල හුල්ල අඬමින් සිටියහ. අපි එයට කාරණය විමසූ විට එතුමාණන් මෙසේ පැවසූහ. කියාමත් දිනය වෙනකම්ම දීර්ඝ වූ කබ්රයේ රාත්‍රිය මතකයට එන විට බියටම ඇඬුණි. එහි පාන්දර (සුබහ්) කියාමත් දිනයයි. එයයි මාව මෙම තත්වයට පත් කළේ යැයි පැවසූහ.

මා හිතවත් මුස්ලිම් සහෝදරවරුණි! කබ්රය ගැනත් කියාමත් දිනය ගැනත් අපහට මග පෙන්වූවන් එයට මුහුණ දෙන ආකාරයත් පෙන්වා දී ඇත. (අල්මපාලිකා පළමු කොටස පිටුව 199)

# මරණය ගැන සිතීමට අවශ්‍ය ඇයි ?

හුජ්ජතුල් ඉස්ලාම් හසරත් ඉමාම් ගස්සාලි ( عليه رحمة الله تعالى ) තුමාණන් පැවසුවේ කෙනෙකුගේ අවසන් හෝරාව ළං වීද කෙනෙකුගේ නිදි යහන පස්වීද කෙනෙකුගේ පදිංචිය කබ්රය වීද කෙනෙකුගේ අවසානය පසේ උකුල වීද, පණුවන්ගේ මිතුරන්වූද, කෙනෙක් මුන්කර්. නකීර්ගේ ප්‍රශ්නවලදී මුහුන දෙයිද කෙනෙකු කියාමත් දිනය ගැන පොරොන්දු දී ඇත්ද තවද කෙනෙකුට ස්වර්ගය නැතිනම් නිරය ඇතුළු වන තැන නම් ඔහුට මරණය හැර වෙන කිසිම සිතුවිල්ලක් නොතිබිය යුතුයි. එය බලාපොරොත්තුවෙන්ම සිටිය යුතුයි. තවද සත්‍ය කුමක්ද යත් තමා මැරුනු අයගෙන් කෙනෙක් යැයි සිතිය යුතුයි.

මක්කිසාදයන් ඉහ්යා නම් ග්‍රන්ථයේ පවසන්නේ ( كُلُّ مَا هُوَ آتٍ قَرِيبٌ ) එනම් සිදුවිය යුතු දේ සිදුවන්නේමයි. (ඉහ්යා උලූමුද්දීන් පිල්ද් 4 පිටුව 475 දාරුල් කුතුබුල් ඉල්මියා බේරූත්)

අල්ලාහ්ගේ දූතයාණන්වූද ඇති උත්තම ( صلى الله عليه وسلم ) තුමාණන්ගේ පාඩමක් ලැබෙන වදනක් නම් කෙනෙක් තමන්ගේ සිතෙන් ප්‍රශ්න කරමින් මරණයට පසු ඇති දේවල්වලට මුහුණ දෙමට ලැස්ති වේද ඇත්ත වශයෙන්ම ඔහු මහා ඥානවන්තයි. (තිර්මිදි හදීස් 2467 පි. 4 පිටුව 207)

## සුළු වීමසීමෙන් ක්ලාන්ත වීම

හසරත් සෙයිදුනා යසීද් රකාෂි ( عليه رحمة الله الشافي ) තුමාණන්ගෙන් කවුරුන් හෝ ඔබ තුමාණන් කෙසේද යැයි ප්‍රශ්න කළොත් මෙසේ පිළිතුරු දෙති. මරණයට පත් වූ කෙනෙකුගේ ගෙය කබ්රය වීද කෘමින් පණුවන් තනි රකීද මේ සියලු දේට එහා කියාමත් දිනය ගැන බලාපොරොත්තුවෙන් සිටීද ඔහුගේ තත්වය කෙසේදැයි විමසමින් සිහි නැතිව ඇද වැටෙති.

## උදේ වරුව කෙසේ තිබුණේද ?

මෙසේම හසරත් සෙයිදුනා මාලික් ඉබ්නු දිනාර් (عليه رحمة الله الغفار) තුමාණන්ගෙන් උදේ වරුව කෙසේ තිබුණේදැයි කෙනෙක් ප්‍රශ්න කළේය. එයට එතුමාණන් එක ගෙයක සිට වෙනත් ගෙයකට (මෙලොවින් එලොවට) මාරු වෙන කෙනෙකුගේ තත්වයට සමාන යැයි (එනම් යන තැන ස්වර්ගයද නිරයද කියා දන්නේ නැත) පිළිතුරු දුන්න. (තන්බිහුල් ගාෆිලින් පිටුව 566 දාර් ඉබ්නු කසීර්)

මා හිතාදර ඉස්ලාමිය (මුස්ලිම්) සහෝදරවරුනි! අපිත් අපට පෙර සිටි ආගමික නායකයින් (මුතුන් මිත්තන්) ගේ මෙම බරකතයන් පිරි ඇති අදහස්වලින් ඔවුන්ටත් එකසේව මරණයත් එලොව ජීවිතය සඳහාත් ලැස්ති වී නැවතත් රැවටීමට ඉඩ නොදී එලොව ජීවිතය වෙනුවෙන් කැප වෙමු.

## සියල්ලට වැඩිය උසස්ම පළඟන

අමීරුල් මූ'මිනීන් හසරත් සෙයිදුනා උමර් ඉබ්නු අබ්දුල් අසීස් ( رحمة الله عليه ) තුමාණන් තමන්ගේ එක් දේශනයකදී මනුෂ්‍යයිනි මෙම ලෝකය ඔබ වෙසෙන්නට ස්ථිර තැනක් නොවෙයි. මෙය එක් අස්ථිර ගෙයක්. මෙය විනාශ වන බවත් මෙහි වාසය කරන්නන් මෙයින් නික්ම යන බවට අල්ලාහ් තආලා පෙන්වාදී ඇත. ඉතා ඉක්මනින්ම ශක්තිමත් අලංකාර නිවෙස් කැඩී බිඳී සුනු විසුනු වී යනු ඇත. එම මාලිගාවන්වල වාසය කරන්නන්ව බලා දුක් වුවන් ඔවුන්වත් ඉතා ඉක්මනින් මෙම ලෝකයෙන් නික්ම යන හැටි දැකින්ම දැක ගනිව්. මිනිසුනේ, අල්ලාහ්තආලා ඔබ වෙත කරුණාව දැක්වීමට නම් මෙම ලොවේ හොඳ දේ එකතු කර හොඳ පිරුණු පළඟනක් රැගෙන යන්න. ඔව් හොඳම භෝජන පළඟන නම් භයයි භක්තියයි යැයි පැවසුහ. (ඉත්යා උලූමුද්දීන් පිල් 4 පිටුව 484 දාරුල් කුතුබුල් ඉල්මියියා බේරූත්)

## ලෝක විනාශය එන්නේමය

කෝටි ගණනක අනුගාමිකයන් පිළිපදින්නන්ගේ ගෞරවනීය ඉමාම් සෙයිදුනා ශාපිඊ ( رحمة الله عليه ) එක් වතාවක් තම දේශනයේදී මෙම ලෝකය අවනම්බු වන පහත්ම තැනයි. මෙහි සියලු දේ නැති වී යන්නේය. මෙහි වාසය කරන මිනිසුන් කබ්රයට යන්නේය. මෙහි සම්බන්ධකම් නැති වී යන බවද සත්‍යයි. තවද මෙහි දියුණු තත්වය නොදියුණු තත්වයට පත්වෙයි. කොතරම් තිබුනත් තව මදි කියන තත්වයක් තිබෙයි. ඇත්ත වශයෙන්ම මෙම

ධන වස්තූන් අඩුවීම ඉතා අල්පයි. අල්ලාහ් ( عَزَّوَجَلَّ ) ගේ ඉදිරියේ බිය භක්තියෙන් සමාව ඉල්ලන්න. තවද ඔහු විසින් දෙන (රිස්ක්) වලින් සෑහීමට පත් වන්න. විනාශය වී යන මේ ලෝකය වෙනුවට සැමදා පවතින පරලොව වෙනුවෙන් ඔබේ ජීවිතය විනාශ වීමට ඉඩ නොතබන්න. ඇති යන සෙවනැල්ල මෙන්ම ඔබේ ජීවිතයද ගරා වැටෙන බිත්තියක්ව ඇත. ඔබේ අමල් (කුසල්) වැඩිකර ලෝක ආශාව අඩු කරන්න යැයි පැවසූහ.

## අද අමල් (පින්) කළ යුතු කාලයයි

හසරත් ශෙයිදුනා මෞලා මුෂ්කිල් කුෂා අලියියුල් මුර්තලා ( كَرَّمَ اللّٰهُ تَعَالٰى وَجْهَهُ الْكَرِيْم ) තුමාණන් කූෆා නගරයේ දේශනයකදී ඇත්ත වශයෙන්ම ඔබ සැම දීර්ඝ සිහින බලාපොරොත්තුවෙන් නොසිටින්න. තවද නම සිහිවිලි වලටද වහල් නොවන්න. මහකයෙන් සිටින්න. ලොකු බලාපොරොත්තුන් කියාමත් දිනය අමතක කරයි. තවද ප්‍රවේසම් වන්න. සිතේ ඇති වන සිහිවිලි වලට වහල්වීමෙන් මාර්ගයෙන් ඈත් කරයි. ප්‍රවේසමෙන් දුන්යා (ලෝකය) ඉක්මනින්ම ඈත්වෙයි. ආහිරත් (පරලොව) ජීවිතය ලං වෙයි. අද අමල් (පින්) කරන දිනයයි. හිසාබ් (ප්‍රශ්න) අසන දිනය නොවෙයි. හෙට හිසාබ් (ප්‍රශ්න) අසන දිනයයි. අමල් (පින්) කරන දිනය නොවේ යැයි පැවසූහ.

# ලෝකය එලොව (ආහිරත්) වෙනුවෙන් ලෑස්ති වීමටම වෙන් කර ඇත

හසරත් සෙයිදුනා උස්මාන් ගනී ( رضي الله عنه ) තුමාණන් තමන්ගේ අවසාන දේශනයේ මෙසේද පැවසූහ. අල්ලාහ් ( عزوجل ) ඔබට මෙලොව (ලෝකය) එලොවට ලෑස්ති වීමටම වෙන්කර ඇත. නැතිව ඔබේ ස්ථිර පදිංචියට නොවෙයි. සත්‍යයෙන්ම මෙලොව විනාශ වන අතර ආහිරත් (එලොව) සැමදා රැඳී පවතියි. මෙය නැති වී යන ලෝකය ඔබව රවටා සැමදා පවතින එලොව දුරස් කරයිද? නැතිවී යන ලෝකය ස්ථිර එලොවට සම නොකරන්න මන්නිසා ද නම් මෙලොව සම්බන්ධය නැතී යන්නේය. සත්‍ය වශයෙන්ම ඔබට අල්ලාහ් ( عزوجل ) වෙත යෑමට සිදුවනු ඇත. අල්ලාහ් ( عزوجل ) ට බයවන්න. මන්නිසාදයත් ඔහුට බිය වීම ඔහුගේ දඬුවමට පළිහක් වන අතර ඔහුට සමීප වීමට මාර්ගයකි. (කළුගුණ නොසලකන ලෝකයකි මෙය රජු හෝ සේවකයා මෙනි රැළුමේ නැත)

## ෂෙයික්හේ තරීකත් අමීරේ අහ්ලුස්සුන්නත් හසරත් අල්ලාමා මෞලානා **මුහම්මද් ඉල්යාස් අත්තාර්** (කාදිරී, රzවී) (دامت بركاتهم العالية) තුමාණන් ගැන කෙටි හැඳින්වීමක්

හිජ්රී 1401 (එනම් 1981 ක්‍රි. ව.) ආරම්භ කරන ලද අල් කුර්ආන් සුන්නතයන් (හදීස්) ප්‍රචාරය කළ හැකි අහ්ලුස් සුන්නත් වල් ජමාඅතයේ දේශපාලනයෙන් තොර ජාත්‍යන්තර සංවිධානය වන දාවතේ ඉස්ලාමී සංවිධානයේ නිර්මාතෘ වන්නේ ෂෙයික්හේ තරීකත් අමීරේ අහ්ලුස්සුන්නත් හසරත් අල්ලාමා මෞලානා අබූ බිලාල් මුහම්මද් ඉල්යාස් අත්තාර් (කාදිරී රzවී) (دامت بركاتهم العالية) තුමාණන්ය. ෂරීඅතයේත්, තරීකතයේත් අමීරේ අහ්ලුස්සුන්නත් තුමාණන්ගේ ගතත් සිතත් කෙසේ පිහිටා තිබේද යත් එතුමාණන්ව දකින්ම සාලිහීන් වරුන්, සුෆියාවරුන් (අල්ලාහ්ගේ සමීපතයන්) මතකයට වන්නේය.

එතුමාණන්ගේ තක්වා (දේව භක්තිය) අප උතුම් නායක (صلى الله تعالى عليه وآله وسلم) තුමාණන් ගෙන ඇති ආදර භක්තිය, අල්කුර්ආන්, තවද සුන්නතයට අනුව හැසිරීමට ඇති උනන්දුව ගෙන සුන්නතයන්ට ජීවයක් ලබාදීමට ඇති ඕනෑකමින් ආශාවත්, පිරිසිදු සිත (ඉඛ්ලාස්) ඉවසීම, යටහත් භාවය, බැගෑපත් බව, ත්‍යාගශීලීභාවය, කෘතඥතාවය, සමාව දීමේ උතුම් ගතිය යනාදී යහ ගුණයන් දේව වන්දනයන් වල වැඩි වැඩියෙන් යෙදී සිටීම. ලෝකය ගැන නොසැලකීම, ඊමානය (විශ්වාසවන්තභාවය) ආරක්ෂා කර ගැනීම් බැරෑරුම්කම ගැන සසුනැවිල්ල, ආගමික අධ්‍යාපන උගන්වීම හා එය ප්‍රචාරය කරවීමට තිබෙන ඕනෑකම විශේෂයෙන් අහ්ලුස්සුන්නත් වල් ජමාඅතයට සේවය කිරීමටත් අල්ලාහ්ට සමීපවූවන් විශේෂයෙන්

සෙයිදුනා ආලා හසරත් අහ්මද් රසාඛාන් ( عليه رحمة الله ) තුමාණන් ගෙන ඇති කිව නොහැකි ආදර භක්තියත්, ප්‍රතිපත්තිය ගෙන ඇති ඇල්මත්, පොදු ජනයාට ආදර කරුණාව දක්වා සේවය කිරීමට ඇති හොඳ අධිෂ්ඨානයේ. මෙසේ සියලු පැති වලින් උසස් මහත්මා ගුණයකින් සමග එතුමාණන්ව දක්වන ලැබෙනු ඇත. තවද ලෙඩ රෝග වලින් මිදී සිටීමට මහ ජනයාට උපදෙස් දෙමින්ද සිටියි. එසේම බොහෝ විශේෂ ලක්ෂණ එතුමාණන්ගෙන් දක්නට ලැබේ.

අමීරේ අහ්ලුස්සුන්නත් (دامت بركاتهم العاليه) , තුමාණන්ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කළ සියලුම වැඩ සටහන් උදාහරණය වශයෙන් කිරල්, නාzකිරා (බලාගෙන කියවීම) තජ්වීද්, ආලිම් පාඨමාලාව, තකස්සුස් ෆිල් ෆික්හ් (මුෆ්ති පාඨමාලාව) ඉෆ්තා (ෆත්වා මාධ්‍ය) අලුත් ප්‍රශ්නයන් පර්යේෂණ කිරීම මෙම කාලයේ ලියා ඇති පොත්පත් ගෙන පර්යේෂණ එහි දී ඇති ආධාර (සාක්ෂිය) නැවත ගෙන පර්යේෂණ කිරීම, තවද දුරකථනය ජංගම දුරකථනය, ඉන්ටර්නෙට් වලින් ෆික්හු සම්බන්ධව, ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම, මදනී මුzාකරා යන නාමයෙන් ජනතාවගේ ආගමික ප්‍රශ්න වලට එවලේම පිළිතුරු දිය හැකි කණ්ඩායම් එක්රැස් කර එයින් ඉබාදත්, පික්හු, ෂරිඅත්, තරීකත්, අකීදා (ප්‍රතිපත්ති) වෙදකම්, තවද මීට අමතරව තව ක්‍රියා මාර්ගයනුත් අමීරේ අහ්ලුස් සුන්නත් (دامت بركاتهم العاليه) , තුමාණන්ට ආගමික අධ්‍යාපනය ගෙන ඇති දැඩි උනන්දුව ගෙන හැර දක්වන අතර ක්‍රියා වෙනුත් දක්නට ලැබේ.

එතුමාණන්ගේ වෙහෙස නොබලා කළ උත්සාහයෙන් ආකර්ශනය වූ ලක්ෂ සංඛ්‍යාත මුස්ලිම් සහෝදරවරුන්,

විශේෂයෙන් තරුණයන් තම ජීවිතයේ (මදනී මාත්තංගල්) මදනී වෙනස්කම් (එනම් ආගමික පැත්තෙන් ශීලාචාරයන්) ඇති කරගත් එයින් ප්‍රතිපලයක් වශයෙන් ඔවුන් ෆර්ල්, වාජිබ්, සුන්නතයන් සම්පූර්ණ කරන අතරම තරුණයන් ඔළුවේ කොළ පාට තලප්පාවක් බැඳ, තම මුහුණේ සුන්නතයට අනුව රැවුලක් ද තැබූහ. එසේම දුශ්චරිත වලින් පිරුණු තැන්වල ගැවසූ ලක්ෂ සංඛ්‍යාත මුස්ලිම් සහෝදරියන් අලුත් නාගරික මුහුණ අත්හැර මදනී බුර්කාව (මුහුණ ඇතුළුව මුළු ශරීරයට වසන ඉස්ලාමීය ඇඳුම) තමන්ගේ ජීවිතයේ ඇත් කළ නොහැකි ඇඳුමක් කරගත්හ.

අමීරේ අහ්ලුස්සුන්නත් (دامت بركاتهم العالية) තුමාණන්ගේ යහ ගුණයන් යහපත් හැසිරීම දැක සිය ගණන් නොවෙයි දහස් සංඛ්‍යාත නොවෙයි. ලක්ෂ සංඛ්‍යාත මුස්ලිම්වරු එතුමාගේ අතේ බයිඅත් කර අල්ලාහ්ගේ සමිපතයන්ගේ (අව්ලියාවරුන්ගේ) නායකයාණන් වන හසරත් ශෙයිඛුනා ගෞසුල් ආලම් දස්තගීර්, මුහ්යද්දීන් ෂෙයික් අබ්දුල් කාදිර් ජිලානි (رضي الله تعالى عنه) තුමාණන්ගේ තුරුළට තමන්ව දා ගත්හ.

මෙසේ එතුමාණන් ජනයාට සේවය කිරීමටම තමන්ව කැප කර සිටිති. අල්හම්දුලිල්ලාහ් (عزوجل) එතුමා ගත් අප්‍රමාණ උත්සාහයෙන් මේ ටික කලකින් දාවතේ ඉස්ලාමියේ සේවය රටවල් 60ට පැතිරී ගොස් ඇත. අමීරේ අහ්ලුස්සුන්නත් (دامت بركاتهم العالية) තුමාණන් විසින් රචිත (ලියන ලද) පොත් පිංචයන්, මදනී මුදාකරා යන ආගමික ප්‍රශ්ණ වල පිළිතුරු කැසට් පටයේ මක්තබතුල් මදීනා වෙන් නැතහොත් ලෝකයේ කොතැනක හෝ සිදුවෙමින් පවතින දාවතේ ඉස්ලාමියේ සුන්නතයන් වලින් පිරුනු සතිපති ඉජ්තිමා වලින්ද ලබාගත හැක.

## සවාබුල් ජාරියා (සදකතු ල්'ජාරියා)
## (දිගටම ලැබෙන කුසල්)

මෙම පොත් පිංච කියවීමෙන් පසු අනුන්ටත් දී උදව් වෙන්න. තවද මීලාද් උත්සව වලත්, අව්ලියාවරුන්ගේ දානයන් (කන්දූරි) වලත්, මංගල්‍යය උත්සව වලදීත්, කතමුල් කුර්ආන් තමාම් කරන අවස්ථාවලත්, තවද ආගමික උත්සව වලදීත්, මළවුන්ට පින් ලබාදීම පිණිසත්, තවද අමාරු දුෂ්කර අවස්ථාවලින් මිදීමත් මෙම පොත මක්තබාතුල් මදනාවෙන් මිළදීගෙන අධික ලෙස පින් (කුසල්) ලබා ගන්න.

الصلاة والسلام عليك يا رسول الله

# සුන්නතයන් හි වසන්තයන්

[illegible]

[illegible]

[illegible]